# තිරසර පුද්ගල සංවර්ධනයකට සාකල්‍යවාදී අධ්‍යාපන ප්‍රවේශය

**ටී.පී.එච්.එන්. ජයන්ත අමරසූරිය**

**හැඳින්වීම**

අධ්‍යාපනය යනු ඉතා වැදගත් මානව ක්‍රියාවලියකි. අධ්‍යාපනඥ කේ.කේ. භාතියා පෙන්වා දෙන පරිදි අධ්‍යාපන ක්‍රියාවලිය සමාජයේ බිහිවීමත් සමඟ ආරම්භ වී මිනිස් සංහතියේ අවසානය තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක වේ. එලෙස ක්‍රියාත්මක අධ්‍යාපනයේ වැදගත්කම පහත දැක්වෙන පරිදි සාරාංශ කර දක්වයි.

අධ්‍යාපනය යනු අත්‍යවශ්‍ය මානව සුචරිතයකි. (Education is an essential Human Virtue) අධ්‍යාපනය මගින් මිනිසා මිනිසෙකු බවට පත් කිරීමට කටයුතු කරන අතරම පුද්ගලයෙකුට තමාට තමා වීමට මාවත සකස් කරනු ඇත. මිනිසා අධ්‍යාපනයෙන් වියුක්ත වූ විට ඔහු මානසික වහල්භාවයෙන් යුක්ත අශිෂ්ට, ම්ලේච්ඡ, දරුණු පුද්ගලයකු බවට පත්වන බව පවසන භාතියා එයින් සිදුවන හානිය දුරුකර ගැනීම සඳහා අධ්‍යාපනය සමාජයට අත්‍යවශ්‍ය සාධකයක් බව කියයි. සාමාජයට අවශ්‍ය පුද්ගලයෙකු අධ්‍යාපනය මඟින් සුදානම් කරන අතර ඒ තුළින් ජීව විද්‍යාත්මක පුද්ගලයා සමාජ අපේක්ෂාවන් ඉටුකරන ඒවා වෙනුවෙන් පෙනී සිටිනසමාජ සත්වයෙක් ලෙස පුරුදු පුහුණු කරයි. එපික්ටීටස් (Epicctetus) ගේ අදහසක් වන "Only Educated are free'' අවධානයට ලක්කරන භාතියා පෙන්වා දෙන්නේ අධ්‍යාපනය නිදහසේ සංකේතය ලෙසයි. තවද ඩියෝජීනස් (Diogenes) දක්වා ඇති පරිදි අධ්‍යාපනය යනු තරුණයන් තුළ ලාලිත්‍ය, ශෝභනත්වය, ශිෂ්ටත්වය පාලනය සඳහාත් වැඩිහිටියන්ට අස්වැසිල්ලක් ගෙන දීමටත්, දුප්පතුන්ට ධනයක් වීමටත් ධනවතුන්ට ආභරණයක් වීමටත් එකසේ උපකාරි වන ක්‍රියාදාමයක් ලෙසයි.

අධ්‍යාපනය පිළිබඳ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක ප්‍රවේශ ඔස්සේ කරුණු විභාග කර බැලීමේ දී අධ්‍යාපනය තුළ ගැබ්විය යුතු

වටිනාකම් හා ඒවා මතු කර ගැනීමෙන් පුද්ගල ජීවිතයත් ඔහුගේ සමාජ ජීවිතයත් තිරසාර සංවර්ධන මාවතකට යොමු වනු නිකය. නමුත් වත්මන් අධ්‍යාපන රටාව තුළ පුද්ගලයන්ගේ සමස්ත සංවර්ධනයට අවශ්‍ය වටිනාකම් ඇතුළත් සංඝටක අධ්‍යාපන ක්‍රියාවලියෙන් ක්ෂය වී යාම හේතු කොට ගෙන තිරසාර පුද්ගල සංවර්ධනය අපේක්ෂාවක් පමණක් වී ඇත. එයින් මිදී පූර්ණ පුද්ගල සංවර්ධනයක් ඇතිකර ගැනීමට වඩාත් උචිත අධ්‍යාපන ප්‍රවේශයක් ලෙස සාකල්‍යවාදි අධ්‍යාපනය (Holistic Education) පිළිබඳ විමසා බැලීමක් මෙම ලිපිය මගින් අපේක්ෂා කෙරේ.

වසර දෙසීයක් පුරා පොදු අධ්‍යාපන ක්‍රමය තුළපුලුල් ලෙස විසිර සිටියා වූ විචාරක කණ්ඩායම් පෙන්වා දුන්නේ බාල හා තරුණ මානවයන් සම්බන්ධ වන අධ්‍යාපනය හුදෙක් අනාගතය සඳහා සේවකයෙකු හෝ පුරවැසියෙකු හැඩගස්වන ක්‍රියාවලියකට වඩා ඉදිරි ක්‍රියාවලියක් විය යුතු බවයි.

ස්විස් ජාතික මානව හිතවාදියෙකු වූ ජෙහාන් පෙස්ටලොසි, ඇමරිකානු පරමෝත්කෘෂ්ටවාදීන් වන තෝරියෝ (Thoreou) එමර්සන් (Emerson) සහ ඇල්කොට් (Alcott), ප්‍රගතිශීලි අධ්‍යාපනයේ ආරම්භකයන් වන ප්‍රැන්සිස් පකාර් සහ ජොන් ඩුවී (Francis Paker and John Dewey) ප්‍රධාන මාරියා මොන්ටිසෝරි සහ රොවුඩොල්ෆ් ස්ටෙයිනර් (Maria Montessori and Roudolf Steiner) ඇතුළු පිරිස දැඩි ලෙස ප්‍රකාශ කළේ සංවර්ධනය වන ළමයා තුළ හොඳ නරක, භාවාත්මක හැඟීම්, ශාරීරික තුලිතය, මනෝ විද්‍යාත්මක සහ අධ්‍යාත්මික යන සංවර්ධනය පිළිබඳ වූ මානයන් (Dimesioms) සංවර්ධනය කිරීමේ කලාව අධ්‍යාපනය ලෙස අවබෝධකර ගත යුතු බවයි. (Forbes Scott J & Robin Ann Martin 2004)

1970 දශකයේ දී විද්‍යාව, දර්ශනය හා සංස්කෘතිකමය ඉතිහාසය යන විෂයයන් පිළිබඳ නැගී එන සාහිත්‍යමය සංකල්පය වර්ධනය අධ්‍යාපනය පිළිබඳ මෙම අදහස අවබෝධ කරවීමේ මාර්ගයක් වූ අතර එම සංකල්පය සාකල්‍යවාදය (Holism) ලෙස හඳුන්වන ලදි.

Holos නැමැති ග්‍රීක වචනයෙන් ව්‍යුත්පන්න වන (Holism) යන පදයෙන් සියල්ල, සමස්තය, සම්පූර්ණ යන අදහස් ජනිත කරයි. එයින් අදහස් වන්නේ යම් පද්ධතියක සියලු කොටස් යන්නයි. පද්ධතියේ සියලු කොටස් එකට ගෙන කථා කරනවා විනා කොටස් හුදකලාව ගෙන නිශ්චය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකියාවක් නොමැත. Holism නොහොත් සාකල්‍ය වාදය පිළිබඳ සාමාන්‍ය අදහස් ඇරිස්ටෝටල් විසින් සිය අධ්‍යාත්මවාදය තුළ (Metaphysics) සංක්ෂිතව සාරාංශ කර දක්වා ඇත.

**සාකල්‍යවාදි අධ්‍යාපනයේ සුවිශේෂී ලක්ෂණ**

සමාජයටත් ස්වභාවික ලෝකයටත්, සෙනෙහස, ආදරය, දායාව, සාමය වැනි ආධ්‍යාත්මික අගයන් සමගත් පුද්ගලයා ඇති කරගන්නා සම්බන්ධතාව මත ඔහු හෝ ඇය තම ජීවිතයට අර්ථයක් අරමුණක් හා අනන්‍යතාවක් සොයා ගනිතියි යන මූලික පිළිගැනීම පදනම් කරගෙන මෙම සාලක්‍යවාදී අධ්‍යාපන ප්‍රවේශය ගොඩ නැගී ඇත.

සාකල්‍යවාදි අධ්‍යාපනය, ඉගෙනුම සඳහා පුද්ගලයා තුළ ප්‍රබල කැමැත්තක් මෙන්ම ජීවිතය පිළිබඳ සත්‍ය වූ ගෞරවාන්විත ආදරයක් ජනිත කරවීම අරමුණු කොටගනී. එය ලෝකයම සංක්ෂිප්ත කර දක්වන උපදේශාත්මක අධ්‍යාපනික විෂයමාලා පැකේජයකින් පමණක් සිදුකළ නොහැකි අතර පරිසරය සමග ඇති කර ගන්නා ඍජු සම්බන්ධතාව යන දෙඅංශය මගින් අත්කර ගැනීමට හැකි වේ. සාකල්‍යවාදී අධ්‍යාපනය (Holistic Education) ඉන්ද්‍රිය බුද්ධියේ ආශ්චර්ය මගින් පෝෂණය වූ සංකල්පයකි. (John P. Miller, 1999)

මානව හැකියාවන් පටු ආකාරයෙන් අර්ථ දක්වනවාට වඩා එම හැකියාව පිළිබඳ අත්දැකීම් හා අර්ථයන් පිළිබඳ වූ බහුවිධ ස්තර හා අන්තර් සම්බන්ධය වටකොට දැකීම සාකල්‍යවාදී චින්තනයේ එක් පැතිකඩකි. සැම පුද්ගලයෙකුගේම බුද්ධිය හා හැකියාවන්, සම්මත කරනලද පරීක්ෂණවල දී ඔවුන් හිමිකර ගන්නා ලකුණු වලට වඩා සංකීර්ණ ස්වරූපයක් දරන බැවින් ළමයා අනාගතයේ හුදු සේවකයකුගේ තත්ත්වය ඉක්ම විය යුතු බව අවධාරණය කරයි.

උදාහරණ ලෙස මොන්ටිසෝරි විසින් සාකච්ඡා කරන ලද ලෝක විෂය පිළිබඳ වූ අධ්‍යාපනය (Cosmic Education) මගින් පුද්ගලයාට, සමස්තයක් වූ විශ්වයේ කොටස් කරුවකු වීමට උපකාර කරන අතරම ඉගෙනුමට ස්වභාවික වශීකෘත භාවයක් ඇතිකර ගැනීමටත් එයට ආරාධනා කිරීමත් සිදුකරයි.

සාකල්‍යවාදී ඉගෙනුමට අනුව අරමුණු කරා ළඟා වීමේදී නිශ්චිත වූ හොඳම එක් මාර්ගයක් නොමැත. ඉගෙනුම් මාවත් බොහෝ තිබෙන අතර, ශික්ෂකයා (Educator) එම සියලු මාවත් අගය කරයි. මෙහි දී එක් පිරිසකට ගැලපෙන විෂය සම්භාරයක්, ඉගෙනුම් අවස්ථාවක් ඒ අයුරින් තවත් පිරිසකට සුදුසු නොවිය හැක. සාකල්‍ය අධ්‍යාපනයේ ඇති මෙම විවිධ ඉගෙනුම් ශෛලීයන් සඳහා ප්‍රතිචාර දැක්වීමේදි හා මානව අවශ්‍යතාවන් විකාශනය වීමේදීත් දැකගත හැක.

ඉගෙනුම්, ඉගැන්වීම්, දෙසට ඇති මෙම ආකල්ප පවුල් තුළ සිදුකරන ශික්ෂණය (Home Schooling) ගුරුවරු, සහ විකල්ප පාසල් ආදිය කෙරෙහි ජනතා පෙළඹවීමක් ඇති කරයි. සාකල්‍යවාදී නැඹුරුවට අයත් මූලධර්මය සපුරා භාවිතයේ යොදවන යම් පාසල් ප්‍රමාණයක් ද ඒවා තුළ කැපවීමෙන් වෙහෙසී වැඩ කරන ගුරු පිරිසක් ද දැකගත හැක. එම කැපවීමේ ඇති සුවිශේෂී ලක්ෂණය වන්නේ පංති කාමර තුළ ඇති දැඩි තරගය වෙනුවට එකමුතුවෙන් කටයුතු කරන පරිසරයක් නිර්මාණය කිරිමයි. පොත්වල ඇති තොරතුරු වෙනුවට සැබෑ ජීවිත අත්දකීම්, තත්කාලීන වැදගත් සිදුවීම්, නෘත්‍යය කලා හා වෙනත් ජීවමාන දැනුම අත්දකීම් මගින් සිසුන්ට ඉගෙනුම් සම්බන්ධතා ඇති කර ගැනීමට ගුරුවරු උපකාරි වේ. ඉගෙනුමට ළමයා තුළ ඇති ආදරය තීව්‍ර කිරීමට ගුරුවරුන්ට හැකිය. කරුණු කට පාඩම් කිරීම වෙනුවට ස්වයංප්‍රවෘත්ත ක්‍රියාව හා ප්‍රශ්නකරණය දිරි ගන්වමින් ගුරුවරයා බුද්ධියෙන් ජීවමානව කටයුතු කළ යුතුය. (Teachers keep alive the “flame of interlligence”) ඉගෙනුම් පසුබට හෝ අධි ක්‍රියාශීලි හෝ ආදි වශයෙන් ළමුන් හංවඩුනොගසා ඔවුන් අතරේ පවතින වෙනස්කම් සමනය කරමින් ළමයා තුළ ගැබ්ව ඇති අද්විතීය ආධ්‍යාත්මික ත්‍යාගය ගුරුවරුන් විසින් ඉස්මතුකර ගත යුතුය.

## සාකල්‍යවාදී අධ්‍යාපනයේ දාර්ශනික චින්තාව

අධ්‍යාපනය පිළිබඳ කිනම් හෝ ප්‍රවේශයක් අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ පැහැදිලි කිරීමක් සිදුකරන්නාසේම සාකල්‍යවාදී අධ්‍යාපන ප්‍රවේශයේ අරමුණු ලෙස පෙන්වා දෙන්නේ ශිෂ්‍යයාට ඔහුගේ විභව්‍යතා අනුව ඔහුට ඔහුම වීමට උපකාරි කිරීමයි. සාකල්‍යවාදි අධ්‍යාපන ප්‍රවේශයේ මෙම අරමුණු ඒබ්‍රහම් මාස්ලෝ විසින් හඳුන්වා දුන්නා වූ ආත්ම සාක්ෂාත්කරණයට සමාන වේ. සාකල්‍ය අධ්‍යාපන ප්‍රවේශය සෑම පුද්ගලයෙකුගේම බුද්ධිය, චිත්තවේග, සමාජමය, කායික, සෞන්දර්යාත්මක, නිර්මාණිබව සහ අධ්‍යාත්මික විභව්‍යතා පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇත. එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන්ගේ සහභාගීත්වයත් ඒ තුළ පුද්ගල හා සාමුහික වගකීම් පිළිබඳවත් අවධාරණය කරයි.

රොබින් ඈන් මාර්ටින් සහ ස්කොට් ෆෝබ්ස් (Robin Ann Martin and Scott Forbes 2004) යන විද්වතුන් සාකල්‍යවාදි අධ්‍යාපන ප්‍රවේශය හා සම්බන්ධ දාර්ශනික චින්තාව ප්‍රධාන තේමා දෙකක් ඔස්සේ පැහැදිලි කර ඇත. එනම් විශිෂ්ටත්වය (Intimacy) සහ බුද්ධිමය නිපුණතාව (Sagacious Competence) විශිෂ්ටත්වය මගින් ඔවුන් පුද්ගලයාගේ බාහිර හා අභ්‍යන්තර ජීවිතයේ එකඟකම, අවිරෝධි බව අවධාරණය කර ඇත. පුද්ගල ආධ්‍යාත්මය ශක්තිමත් කිරීම තුළින් පුද්ගලයා අවබෝධයට, ප්‍රඥාවට ළඟා වනබව කියයි. ඒ අනුව සාකල්‍යවාදී අධ්‍යාපන ප්‍රවේශයේ ඉතා වැදගත් දාර්ශනික චින්තාව ලෙස අධ්‍යාත්ම සංවර්ධනයට ඉහළ වටිනාකමක් ලබා දී ඇත. ආගම් දෘෂ්ඨිකෝණයකින් විශිෂ්ටත්වය යන්න පැහැදිලි කළ සාකල්‍යවාදීන් විශිෂ්ටත්වය යන පදය මනෝවිද්‍යාත්මක දෘෂ්ටියකින් ද විග්‍රහ කර ඇත. ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධුරාවලියේ දක්වෙන ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතාවට සමාන වන බව දක්වන ඔවුන් සෑම පුද්ගලයෙකුම තමන් තමාට ගැලපෙන ස්ථානය සොයා යාමට උත්සහා කළයුතු බව කියයි. එහිදි ඉගෙනුම් ලාභීන් අතර වෙනසක් පැවතියේ ද ඔහු තුළ ඌනතාවක් නොමැති බව කියයි.

සාකල්‍යතාවදීන් ඉදිරිපත්කළ දෙවන දාර්ශනික අදහස බුද්ධිමය නොහොත් ප්‍රඥාධික නිපුණතාව ක්ෂේත්‍ර හයක් යටතේ ගොනුකර දක්වයි.

1. මනෝවිද්‍යාත්මක හැඟීම් දැනීම් ඇතිකරවන නිදහස
2. යහපත් විනිශ්චය
3. ඉගෙනුම් ලාභියාටම ආවේනික ඉගෙනුම් ක්‍රම
4. සමාජමය හැකියා
5. අගයන් පිරිපහදු කර චර්යාවට එකතු කර ගැනීම
6. තමා පිළිබඳ අවබෝධ නොහොත් චිත්තවේග සංවර්ධනය

රොබින් සහ ස්කොට් ෆෝර්බිස් ඉදිරිපත් කළ දාර්ශනික අදහස් මගින් සාකල්‍යවාදී අධ්‍යාපනය ඉහළ ප්‍රජානන හැකියා තහවුරු කරන අධ්‍යාපනික ප්‍රවේශයක් බව තහවුරු වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අධ්‍යාපනික අරමුණු පිහිටුවා ගැනිමේ දි ඉහළ ප්‍රජානන හැකියා  තහවුරු වන පරිදි අධ්‍යාපන අරමුණු පිහිටුවිමේ වැදගත්කම බෙන්ජමින් බ්ලුම් විසින් අවධාරණය කර තිබුණ ද වත්මන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අධ්‍යාපනික අරමුණු පිහිටුවා ගැනීමේ දී පහළ ප්‍රජානන හැකියා සඳහා අරමුණු පිහිටුවා ගන්නා අයුරක් දක්නට ඇත.  එමගින් රටට අවශ්‍ය නිර්මාපණ හැකියා සහිත පුද්ගලයන් බිහිවිමේ ඌනතාවක් දක්නට ඇත.  එමෙන්ම රට තුළ තිරසාර සංවර්ධනයකට තුඩුදෙන ශ්‍රම බලකායක් ගොඩ නගා ගැනීම අසීරු කරුණක් බවට පත්ව ඇත.

එම අභියෝග ජය ගැනීම සඳහා සාකල්‍යවාදී අධ්‍යාපන ප්‍රවේශයේ ඇතුළත් දාර්ශනික චින්තාව,  විෂය මාලාව, ඉගැන්වීමේ ක්‍රමවේද හඳුනාගෙන වත්මන් අධ්‍යාපන රටාව හා සම්බන්ධකොට දියත් කිරීම පළමුව තිරසර පුද්ගල සංවර්ධනයයක්ද අනතුරුව රටතුළ තිරසර සංවර්ධනයක් ද ගොඩ නඟා ගැනීමට හේතුවනවා ඇත.

**සාකල්‍යවාදී අධ්‍යාපනයේ විෂය මාලාව**

උපයෝගීතාවයෙන් වඩා ඉහළ අධ්‍යාපනයක් සඳහා සාකල්‍යවාදී අධ්‍යාපන චින්තකයින් ඉදිරිපත් කරන විෂයමාලාව තුළ සුවිශේෂී ලක්ෂණ දක්නට ඇත.  පුද්ගලයාගේ දැනුම, ආකල්ප, කුසලතා, පෞරුෂය හා සමාජ කුසලතා ආදි සියල්ල දියුණු කිරිමේ ආභිලාෂය

සහිත ක්‍රියාත්මක වනමෙම ප්‍රවේශයේ දී මූලික විෂය ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගෙන ඇත.

1. ළමයින් පළමුව ඔවුන් පිළිබඳව ඉගෙනීම (Children need to learn about them selves) මේ යටතේ ස්වයං ගරුත්වය, ස්වයං අභිමානය පිළිබඳ ළමයා, උගත යුතුය.

2. ළමුන් සම්බන්ධතා පිළිබඳ උගත යුතුය. (Children need to learn about relationship) අන් අය සමඟ පවත්නා සබඳතා පිළිබඳ හා සමාජ බලපෑම පිළිබඳ ළමයි උගත යුතුය. ඒ සඳහා ළමයා තුළ සමාජය පිලිබඳ දැනුවත් භාවය (Social Literacy) චිත්තවේගික අවබෝධය වැදගත් (Emotional Literacy) බව අවධාරණය කරයි.

3. විවිධ ගැටලුකාරි තත්වයන්ට පාත්‍රවුවද නැවතත් යථා තත්ත්වයට පත්වීමට ළමයින් ඉගෙන ගත යුතුය. එලෙස ලබන ඉගෙනුම අභියෝගවලට මුහුණ දීමටත් අපහසුතා වලින් මිදීමටත් උපකාරි වන අතර දිර්ඝ කාලීන සාර්ථකත්වයක් සහතික කර ගැනීමට අවශ්‍ය මාවත විවර කරන බව පෙන්වාදෙයි.

4. සිව්වනුව ළමයින් සෞන්දර්ය ඉගෙනගත යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වටා ඇති වටපිටාවේ චමත්කාරය දක්නට උනන්දුවන අතර, ලෝකය කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත බියක් ජීවිතයට එකතුකර ගැනීමට කටයුතු කරනවා ඇත.

**සාකල්‍යවාදී අධ්‍යාපනයේ භාවිත වන ඉගැන්විම් උපායමාර්ග හා උපකරණ**

ළමයාගේ එක් කොටසකට නොව සමස්තයටම අධ්‍යාපනය ලබා දීම අරමුණු කරගත් මෙම අධ්‍යාපන ප්‍රවේශය මගින් මිනිසුන් ඉගෙන ගන්නේ කෙසේද? ඔවුන්ට උගන්වන්නේ කෙසේද? යන ප්‍රශ්නවලට පිළිතරු වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරන උපාය මාර්ග හඳුනාගෙන ඉදිරිපත් කරයි. ඒ සඳහා ඔවුන් පළමු කොට ඉගෙනීම පිළිබඳ පරිනාමණ ප්‍රවේශය (Transformative Approach) හඳුන්වාදෙයි. පුද්ගලයා කොටු වි සිටින රාමුවෙන් පිටතට ඒම සඳහා එම ප්‍රවේශය ප්‍රයෝජනවත්

බව පවසයි. ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ මෙතෙක් පැවති සම්ප්‍රේෂණ ගුරු භූමිකාව හා සංවාදාත්මක ගුරු භූමිකාව බැහැර කරයි. රාමුවෙන් බැහැරව වෙනස්වීම තුළ නව අදහස්, මානසික පුරුදු, විශ්වීය දැක්මක් වර්ධනය වේ. සාකල්‍යතාවාදයට අනුව දැනුම යනු පුද්ගලයා ජීවත්වන සංදර්භය තුළ ගොඩනගා ගන්නා එක් දෙයක් පමණි. එබැවින් ඉගැන්වීම මගින් අත්‍යවශ්‍ය තොරතුරු පිළිබඳ දැනුවත්භාවයට පත්වීම පිළිබඳ විවේචන එල්ල වී ඇත. සංදර්භයට කොටුකර දැනුමක් ලබාදෙනු වෙනුවට ළමයින්ට විවේචනාත්මක හා පරාවර්තක චින්තන කුසලතා වර්ධනය කරගැනීමටත් ඔවුන් වටා පවතින ලෝකය පිළිබඳ සැලකිලිමත් වීමට උනන්දු කරවීම මගින් පුද්ගල හා සමාජ පරිනාමණය කුමන ප්‍රමාණයකින් සිදුවිය යුතු ද යන්න තිරණය කරනු ඇති බව සාකල්‍යවාදි මතධාරීන් ප්‍රකාශ කරයි.

ඉගැන්විම් උපාය මාර්ගයක් ලෙස සාකල්‍යවාදීන් හඳුන්වාදෙන දෙවන සංකල්පය වන්නේ දැනට අධ්‍යාපනයේ දක්නට ලැබෙන විෂය ඛණ්ඩනීකරණය නොහොත් කැබලි කිරීමට ප්‍රතිවිරුද්ධව ඉදිරිපත් කරන සම්බන්ධය නැතහොත් සමෝධානය අවධාරණය කරයි. (Fragmentation) නොහොත් ඛණ්ඩනීකරණය මගින් අධ්‍යාපනයට සම්බන්ධ විෂයයන්, ළමයින් විවිධ වර්ගීකරණයන්ට ලක් කිරීම ආදිය මගින් ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලිය දියත් කිරීමට කටයුතු කළත් සාකල්‍ය ප්‍රවේශයට අනුව පුද්ගල ජීවිතය හා ජීවත්වීම එකට සම්බන්ධවීම මගින් ජීවන දෘෂ්ටීන් බෙහොමයක් අත්කර ගැනීමට හැකිබව පෙන්වා දෙයි. එමනිසා එකිනෙකට වෙනස් මූලිකාංග කිහිපයකට අධ්‍යාපනය හුදකලා නොකළ යුතුබව පෙන්වාදෙයි. මිනිසුන් දන්නේ මොනවාද? ඒවා ඔවුන් දන්නේ කෙසේද? ඔවුන් ලෝකය තුළ කටයුතු කරන්නේ කෙසේද? ආදී එකිනෙකට වෙනස්කරන්නට නොහැකි පදාර්ථ ලෙසත් ඒවා අපේ ජීවිත හා අපේ ලෝකය යන එකිනෙක කරුණු මත රඳා පවතින සංකල්ප ලෙස විස්තර කරයි. සාකල්‍යවාදීන් අවධාරණය කරණ සම්බන්ධතාව (Connections) පදනම් කරගෙන සාකල්‍ය අධ්‍යපන ප්‍රවේශයට අනුව පන්තිකාමර සාමාන්‍යයෙන් කුඩා ඒවා වන අතර ඒවායෙහි මිශ්‍ර හැකියා ඇති සිසුන් හා මිශ්‍ර වයස් මට්ටම් සහිත දරුවන් ඉගෙනුම ලබයි. ව්‍යුහාත්මකව සකස්විමේ දි ඉතා නම්‍යශීලි ලෙස කටයුතු කරන අතර

එය සිසුන්ට උචිත පරිදි අධ්‍යාපන වර්ෂය තුළ වෙනස්කම් ඇති කර ගැනීමට අවකාශ ලබාදෙනවා ඇත. මෙම නම්‍යශීලි වෙනස්වීමේ හැකියාව සිසුන් තුළ අධ්‍යාපන සංකල්ප ඉගෙනීම පිළිබඳ අනවශ්‍ය කලබලකාරි බවක් හෝ පීඩනයක් ඇති නොකරයි. තවද, සංකල්ප ක්ෂණිකව ඉගෙනුමට යාමේ දි සිසුන් පසු පසට තල්ලුවීමේ ගැටලුව අවම වන බව පෙන්වා දෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ තිබිය යුතු අර්ථාන්විත භාවය තවත් ඉගෙනුම් උපාය මාර්ගයක් ලෙස සාකල්‍යවාදීන් හඳුනා ගෙන ඇත. ඉගෙන ගන්නා දේ ඉගෙනුම් ලාභියාට වැදගත් යැයි හැඟීයන විට ඉගෙනුම් ලාභියා තුළ ඉගෙනුම සඳහා ඇති උනන්දුව වර්ධනයට හේතු වේ. සාකල්‍යවාදී ප්‍රවේශයක් සහිත පාසල් අර්ථවත් ව්‍යුහයක් සහිතව කටයුතු කරන පුද්ගලයන්ට ගරු කිරීමටත් ඔවුන් සමග වැඩ කිරීමටත් වැඩි උනන්දුවක් දක්වනු ඇත. එම නිසා ඉගෙනුමට මුල පිරීම ළමයින්ට තිබෙන ලෝක විෂයික දැනුමෙන් ආරම්භ කළ යුතුය. එමෙන්ම ළමයින්ට අර්ථවත් දේ මිස වෙනත් අය විසින් ළමයින්ට අර්ථවත් වේයැයි සිතන දේ දීමට උත්සාහ නොගත යුතුය. අර්ථාන්විත භාවයට සම්බන්ධ අනෙක් කරුණ ලෙස අධි ඉගෙනුම් සංකල්පය පිළිබඳ කරුණු අවධාරණය කරයි. ඉගෙනුම් ක්‍රියාවලියෙහි ඇති නෛසර්ගික අදහස සොයා ගැනීමත්, ඔවුන් ඉගෙන ගන්නා ආකාරයත් අවබෝධ කර ගැනීමෙන් සිසුන් තමන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය තුළ යම් පමණ ස්වයං පාලනයකට යොමුවන බව පෙන්වා දෙයි. සාකල්‍ය අධ්‍යාපනය ප්‍රජාවේ ස්වභාවය වන පන්ති කාමරය තුළ හෝ ඉන්පිටත සිටින ප්‍රජාව හා පවත්වන අන්‍යෝන්‍ය රැඳියාව පදනම් කරගෙන තම ඉගෙනුම් නියාමනය කිරීමට සිසුන් යොමුවන බව අවධාරණය කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. Bhatta Panduranga,C., Holistic Personality Development Through Education:Ancient Indiana Cultural Experiences, 2007,.http://web1.iimcal.ac.in/research/download cpbhatta.pdf

2. Bhathiya,K.KPrinciples of Education.New Delhi:Kalyani publishers, 1981.

3. Roger , Sue Stack, Holistic education network January, 29,2005.Retrieved

January,29,2011from http://www.hent.org/hent.htm. Ron Miller, Holistic Education, 2000, Retrieved January,30,2011fromhttp://4. 4. www.infed.org/biblio/holistic Education.htm

5. https://en,wikipedia.org/wikil/Holistic/education